# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2388/34 – 2024 ජුනි මස 13 වැනි බ්‍රහස්පතින්දා – 2024.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

නිවැරදි කිරීමයි

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**පානීය ජලය හා ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මුද්‍රණ දෝෂ දැනුම් දීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2368/26 - 2024 ජනවාරි මස 27 වැනි සෙනසුරාදා දින රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලද IV (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන ශීර්ෂය යටතේ වන මධ්‍යම පළාතේ පළාත් සභා අතුරු ව්‍යවස්ථාවෙහි පිටු අංක 16 A සිට පිටු අංක 23 A හි අන්තර්ගත ''නාවලපිටිය නගර සභාවේ පානීය ජලය හා ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව'' සහිත *ගැසට් පත්‍රයෙහි* පහත කරුණු සංශෝධනය විය යුතුව ඇත.

1. 17 A පිටුව හි අංක 02 යටතේ දක්වා ඇති ''මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට (255 වන අධිකාරය) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 157 (12) (ඌ) යන උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 උප වගන්තිය යටතේ *ගම්පොල නගර සභාවට* බලය පිරිනැමී ඇත.'' යන්න ''මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට (255 වන අධිකාරය) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 157 (12) (ඌ) යන උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 උප වගන්තිය යටතේ *නාවලපිටිය නගර සභාවට* බලය පිරිනැමී ඇත.'' ලෙස සංශෝධනය විය යුතුය.

2. පිටු අංක 23 A පිටුව හි දක්වා ඇති ''*ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය* තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.'' යන්න ''*නගර සභා බල ප්‍රදේශය* තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.'' ලෙස සංශෝධනය විය යුතුය.

කේ. පී. චාන්දනී,
ලේකම් (*වැ.බ.*)
නාවලපිටිය නගර සභාව.

EOG 06 - 0118

1A – PG6718 – 05 (2024/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*